වාර්ෂික වාර්තාව - 2023

வருடாந்த அறிக்கை - 2023

ANNUAL REPORT - 2023



සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நலன்புரி நன்மைகள் சபை
நிதி, திட்டமிடல் மற்றும்
பொருளாதார அபிவிருத்தி அமைச்சு
Welfare Benefits Board
Ministry of Finance, Planning and Economic Development

පටුන

වාර්තාව සංක්ෂිප්තව	**01**
වාර්තාව පිළිබඳ සාරාංශය	**01**
1. වන පරිච්ඡේදය- සංවිධානය	
1.1 දැක්ම	**02**
1.2 මෙහෙවර	**02**
1.3 සංවිධානයේ අරමුණු	**02**
1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්	**02**
1.5 සංවිධාන ව්‍යුහය	**03**
1.5.1 මානව සම්පත් පැතිකඩ	**03**
1.5.2 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිල ධූරාවලිය	**05**
2. වන පරිච්ඡේදය -නීතිමය රාමුව සංවිධානය පිහිටුවීමට අදාල නීතිමය පසුබිම	**06-09**
3. වන පරිච්ඡේදය -සභාපතිවරයාගේ විවරණය	**10**
4. වන පරිච්ඡේදය -කාර්යසාධනය	**11**
4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - **2023**	**11**
4.2 කාර්ය සාධනය	**11**
4.3 කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය	**13**
4.4 සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීම “අස්වැසුම” වැඩසටහන	**13-15**
4.5 අස්වැසුම වැඩසටහන සඳහා සාමාන්‍ය තේරීම් නිර්ණායක	**16**
4.6 පුද්ගලයින් තෝරා ගැනීම	**16-24**
5. වන පරිච්ඡේදය- වර්ෂය සඳහා සමස්ත මූල්‍ය ප්‍රකාශ	**25**
5.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ අයවැය	**25**
5.2 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ මූල්‍ය වාර්තා	**25-26**
5.3 විගණකාධිපති වාර්තාව	**31-37**
5.4 විගණකාධිපති වාර්තාව මත කරුණු පැහැදිලි කිරීම	**38**

6. වන පරිච්ඡේදය - කාර්යභාරය ඉටුකිරීමේදී මුහුණදුන් අභියෝග හා ගැටළු **39**

වගු සටහන්

වගු අංක **1.1** කාර්ය මණ්ඩල තොරතුරු **04**

වගු අංක **2.1** අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය **07**

වගු අංක **2.2** වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, හඳුනානොගත් වකගඩු රෝගීන්, **07-08**
වැඩිහිටි අධාර ලබන තැනත්තන් සඳහා ගෙවීම්

වගු අංක **4.1** (සංගණනනය කරන ලද අයදුම්පත් සංඛ්‍යාව) **17**

වගු අංක **4.2** (දිස්ත්‍රික් වශයෙන් තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව) **17**

වගු අංක **4.3**(ලද මුළු අයදුම්පත් අභියාචනා සංඛ්‍යාව) **19**

වගු අංක **4.4** (දිස්ත්‍රික් වශයෙන් ලද විරෝධතා සංඛ්‍යාව) **20**

වගු අංක **4.5** (ජූලි සිට දෙසැම්බර් දක්වා ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව) **22**

වගු අංක **4.6** (ප්‍රතිලාභීන් ලැබූ ප්‍රතිලාභ මුදල-ජූලි සිට දෙසැම්බර් දක්වා) **23**

වගු අංක **5.1** (2023 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක මූල්‍ය තත්ත්වය) **25**

වගු අංක **5.2** (2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) **25-26**

වගු අංක **5.3** (2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය) **26**

වගු අංක **5.4** (අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය) **27**

රූප සටහන්

රූප සටහන් **01** (සංවිධානයේ ව්‍යුහය) **05**

ප්‍රස්ථාර සටහන්

ප්‍රස්ථාර **1** (මුළු අයදුම්පත් සංඛ්‍යාව) **18**

ප්‍රස්ථාර **2** (සංගණනනය කරන ලද සහ දිස්ත්‍රික් වශයෙන් සුදුසුකම් ලැබූ ලද අයදුම්පත් සංඛ්‍යාව) **20**

ප්‍රස්ථාර **3** (ලද මුළු අයදුම්පත් අභියාචනා සංඛ්‍යාව) **21**

ප්‍රස්ථාර **4** (දිස්ත්‍රික් වශයෙන් ලද විරෝධතා සංඛ්‍යාව) **22**

ප්‍රස්ථාර **5** (ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව-ජූලි සිට දෙසැම්බර් දක්වා) **23**

ඇමුණුම **40-45**

වාර්තාව පිළිබඳ සංක්ෂිප්තව

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවා අංක 1952/22 හා 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක විය.මෙම පනතේ 9 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවෙන් අනුමත කර ඇති අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය 2022 දී ආරම්භ කළ අතර ඒ සඳහා අයදුම්පත් කැඳවා තොරතුරු සංගණනය කිරීම තුළින් සමාජ ආරක්ෂණ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පියවර ගෙන ඇත. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව තුළින් සුභසාධක ප්‍රතිලාභ පනත යටතේ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට පැවරී ඇති කාර්යභාරය 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අදාල කාර්යසාධනය ඉදිරිපත් කර ඇත.

වාර්තාව පිළිබඳ සාරාංශය

මෙහිදී 2023 වර්ෂය තුළ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සංයුතිය මෙන්ම 2023 වර්ෂයට අදාලව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනට අදාල සියලු වාර්ෂික ගිණුම් වාර්තාවන්, විගණන වාර්තාවන් මෙන්ම අස්වැසුම ගෙවීම් ක්‍රියාවලිය ඇතුලත් වගු සටහන් මෙන්ම ප්‍රස්තාර ආකෘති මගින් සංක්ෂිප්තය ඇතුලත් වන සේ මෙම වාර්තාව සකස් කර ඇත.

1 වන පරිච්ඡේදය - සංවිධානය

1.1 දැක්ම

“අවැසි තැන අස්වැසුම සදමින් ශ්‍රී ලාංකීය දිළිඳු ජන ජීවිත ප්‍රශස්ථ මට්ටමකට ඔසවා තැබීමේ ගමනෙහි පෙරගමන්කරු බවට පත්වීම.’’

1.2 මෙහෙවර

සුභසාධක ප්‍රතිලාභ පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට ශ්‍රී ලංකා සුබසාධන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පැනනඟින අවශ්‍යතා හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙවර විය. මේ අනුව, මෙහෙවර ප්‍රකාශය පහත පරිදි වේ.

“ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී විනිවිදභාවය සහ සමානාත්මතාවය සහතික කරමින් සියලුම ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා සංගත සුබසාධන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම”.

1.3 සංවිධානයේ අරමුණු

- සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා නීතිමය රාමුවක් සැකසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා පාරදෘෂ්‍ය ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම;

- පනත මඟින් පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.
- මණ්ඩලයට පවරනු ලැබ ඇති ඕනෑම බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකු වෙත පැවරීම.

- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සැලසුම් කිරීම.
- සුදුසුකම් ලැබීම සඳහා වන නිර්ණායක සකස් කිරීම.
- යෝජනා ක්‍රම අනුව මූල්‍ය ප්‍රතිපාදන නිශ්චය කිරීම.
- සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියක් සකස් කිරීම
- සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහාය ඇතිව සමාජ ආරක්ෂණ දත්ත ලේඛනයක් පවත්වාගෙන යාම.

1.5 සංවිධානයේ ව්‍යුහය

1.5.1 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

සුබසාධක ප්‍රතිලාභ පනතේ ප්‍රතිපාදන අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සභාපතිවරයා සහ තවත් සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් සමන්විත වේ.
2022.07.07 වන දින සිට 2023.08.14 වන දින දක්වා බී. විජයරත්න මහතා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ අතර 2023.08.24 වන දින ජයන්ත විජේරත්න මහතා නව සභාපතිවරයා වශයෙන් පත් විය.

එමෙන්ම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2023 වර්ෂය තුළ සිටි අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

- බී. විජයරත්න මයා – සභාපති/ කොමසාරිස්
- කමල් පත්මසිරි මයා – සාමාජික
- ඒ.ආර්. දේශප්‍රිය මයා – සාමාජික
- කුමාර දුනුසිංහ මයා – සාමාජික
- කේ.එච්. ජෙසී මුලර් මිය – සාමාජික

2023 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වා ඇත

2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ බඳවාගෙන ඇති කාර්ය මණ්ඩලය මෙන්ම පුරප්පාඩු තනතුරු පිළිබඳව පහත වගුවෙන් දක්වා ඇත.

කාර්ය මණ්ඩල තොරතුරු - **2023.12.31**


(වගු අංක1.1)

සේවක වර්ගය	**තනතුර**	**අනුමත සේවක සංඛ්‍යාව**	**තත්‍ය සේවක සංඛ්‍යාව**	**පුරප්පාඩු ගණන**	**අතිරික්ත ගණන**
ජ්‍යෙෂ්ඨ මට්ටම	සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්	1	1	0	0
	අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්	4	3	1	0
	නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්	2	0	2	0
	සහකාර සුබසාධක කොමසාරිස්	8	0	8	0
	අභ්‍යන්තර විගණක	1	0	1	0
ද්විතික මට්ටම	මෘදුකාංග සංවර්ධක	1	0	1	0
	පද්ධති පරිපාලක	1	0	1	0
	තොරතුරු තාක්ෂණ විධායක	2	1	1	0
	සංවර්ධන නිලධාරී	1	0	1	0
	කළමනාකරණ සහකාර	8	0	8	0
	උපකාරක මෙහෙයුම් ක්‍රියාකරු	3	0	3	0
ප්‍රාථමික මට්ටම	රියදුරු	2	1	1	0
	කාර්යාල කාර්ය සහායක	2	2	0	0
අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම	මෘදුකාංග සංවර්ධක (කොන්ත්‍රාත්)		1	0	0
	පද්ධති පරිපාලක (කොන්ත්‍රාත්)		1	0	0
එකතුව		**36**	**10**	**28**	**0**

සංවර්ධන නිලධාරී තනතුරු 09ක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට අනුයුක්ත කිරීමට හැකිවන පරිදි මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත අනුමත කර ඇති අතර එම තනතුරු 09න් තනතුරු 07ක් සඳහා නිලධාරීන් අනුයුක්ත කර ඇත.

1.5.2 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිල ධූරාවලිය පහත දක්වා ඇත.

(රූප සටහන් අංක 1)



.

2 වන පරිච්ඡේදය - නීතිමය රාමුව

2002 වර්ෂයේදී පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන මඟින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කර ඇති අතර එම කටයුතු පරිපාලනය කිරීම පිණිස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා ඇත.

පනත මඟින් අපේක්ෂිත අරමුණු :-

1. සියළුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් සඳහා සහ ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා නීතිමය රාමුවක් සකස් කිරීම
2. සුබසාධක ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා පාරදෘශ්‍ය ක්‍රියාවලියක් සකස් කිරීම
3. ඊට ආනුශාංගික කරුණු

මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ. මෙම පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පහත සඳහන් පරිදි පිහිටුවීම සඳහා පනතේ විධිවිධාන සලස්වා ඇත.

විෂයභාර අමාත්‍යවරයා විසින් ව්‍යවස්ථාදායක සභාව විමසා සභාපතිවරයෙකු සහ තවත් සාමාජිකයින් සිව්දෙනෙකු පත් කළ යුතුවේ. ඔවුන්ගේ ධුරකාලය අවුරුදු 3ක් වේ. මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී වන සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස් වශයෙන්ද ක්‍රියා කෙරේ. මේ අනුව දැනට මෙම මණ්ඩලය පත්කර ක්‍රියාත්මක වේ.

මෙම පනතේ විධිවිධාන අනුව මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිදි අතිරේක කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන් හා සහකාර කොමසාරිස්වරුන් පත් කිරීමට විෂයභාර අමාත්‍යවරයාට බලතල හිමිවේ. තවද සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිදි දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ග්‍රාම නිලධාරීන්ට හෝ වෙනත් රජයේ නිලධාරීන්ට කාර්යයන් පවරා දිය හැක. මේ අනුව සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් අදාල දිස්ත්‍රික් සඳහා අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වශයෙනුත් සියළුම ප්‍රාදේශීය ලේකම්වරු අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සඳහා නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වශයෙනුත් පනතේ විධිවිධාන ප්‍රකාරව නිලයෙන් පත්කරමින් ගැසට් පත්‍රයේ පලකර බලතල පවරනු ලැබ ඇත. තවද සියළුම ග්‍රාම නිලධාරීන්ට ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුළ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා බලතල පවරා රාජකාරී වැඩ ලැයිස්තුවක්ද ලබා දී ඇත.

සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ඕනෑම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා නියමිත තොරතුරු ඇතුලත්වූ යෝජනා ක්‍රම සකස් කර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පලකර පාර්ලිමේන්තුවෙන්

පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ. එවැනි යෝජනා ක්‍රමයක් සංශෝධනය කිරීමේදී ද එම ක්‍රියාවලියම අනුගමනය කළ යුතු වේ.

මේ අනුව 2023.04.21 දිනැති අංක 23 28/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනාක්‍රමය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර ඒ මඟින් පහත සඳහන් සමාජ කාණ්ඩ වලට අයත් පවුල් / පුද්ගලයින් ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලබා ඇත.

I වන උප ලේඛනය

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය

(වගු අංක 2.1)

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය		*සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව*	*පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුබසාධන ප්‍රතිලාභ දීමනාව(රු.) **
(i)	**සංක්‍රාන්තික** **2023 දෙසැම්බර් මස 31 දක්වා**	**400,000**	**2,500**
(ii)	**අවදානමට ලක් වූ** **2024 මාර්තු මස 31 දක්වා**	**400,000**	**5,000**
(iii)	**දුප්පත්** **2023 ජූලි 01 සිට වසර 03 ක් දක්වා**	**800,000**	**8,500**
(iv)	**අන්ත දිළිඳු** **2023 ජූලි 01 සිට වසර 03 ක් දක්වා**	**400,000**	**15,000**

- සටහන - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 2 හෝ 2 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභීන් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතුය.

II වන උපලේඛනය

වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, හඳුනානොගත් වකගඩු රෝගීන්, වැඩිහිටි අධාර ලබන තැනත්තන් සඳහා ගෙවීම්

(වගු අංක 2.2)

සුබසාධක ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩය	*දැනට සුබසාධක ප්‍රතිලාභ ලබන තැනැත්තන් සංඛ්‍යාව*	*පවුල් ඒකකයට අයත් තැනත්තන් සංඛ්‍යාව දළ වශයෙන් ***	*මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.)*

(1)		*(2)*	*(3)*	*(4)*
(i)	ආධාර ලබන වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්	72,000	21,000	5,000
(ii)	වකුගඩු ආධාර ලබන තැනැත්තන්	39,150	19,500	5,000
(iii)	වැඩිහිටි ආධාර ලබන තැනැත්තන්	416,667	250,000	2,000

** සටහන - II වන උපලේඛනයෙහි (3) වන තීරුවේ සඳහන් දීමනා හිමි පවුල් ඒකකයට අයත් තැනැත්තන් ඉහත I වන උප ලේඛනයෙහි සඳහන් ප්‍රතිලාභ ලබන පවුල් ඒකකයක් තුළට ඇතුළත් වන බැවින් ගෙවීම් සිදු කිරීමේ දී එකි I වන උප ලේඛනයේ හිමි දීමනාවට මෙම II වන උපලේඛනයෙහි (4) වන තීරුවේ සඳහන් දීමනාව ද එකතුකර ගෙවීම් සිදු කළ යුතුය.
උපලේඛන II හි සඳහන් ප්‍රතිලාභ වසරක කාලයක් සඳහා ලබා දිය යුතු අතර, සුදුසුකම් සමාලෝචනය කිරීමෙන් අනතුරුව එම ප්‍රතිලාභ තවදුරටත් ලබා දීමට කටයුතු කිරිම.

මෙම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කෙටුම්පත් කිරීම සඳහා 2022 වර්ෂයේ දී විෂයයට සම්බන්ධ රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සහ විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ මත යෝජනා ක්‍රමය සකස්කර ඇත.
පනතේ 9 වැනි වගන්තිය අනුව අනුමත කර ක්‍රියාත්මක කරනු ලබන යම් සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් මත ප්‍රතිලාභීන් තෝරාගැනීම නියමිත නිර්ණායක හා තෝරාගැනීමේ ක්‍රමවේදයක් අනුව සිදුකළ යුතු වේ. එබැවින් ප්‍රතිලාභ අපේක්ෂිත අයදුම්කරුවන්ගේ තොරතුරු සනාත කරගනිමින් ප්‍රතිලාභ සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගැනීම හා වර්ග කිරීම සඳහා සුදුසු තෝරාගැනීමේ ක්‍රියාපටිපාටියක්, සුදුසුකම්ලාභීන් තීරණය කිරීම සඳහා දත්ත රැස් කිරීමේ හා දත්ත අනුව නිර්ණායක ඊට බරතැබීම් හා දර්ශක පදනම් කරගත් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ සඳහා අදාල විෂය ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන් එක්ව ක්‍රියාකර ඇත අතර මෙම විෂයට අදාල විශේෂඥතාවයක් දක්වන ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික දායකත්වය ලබා දී ඇත.
මෙම තෝරාගැනීමේ නිර්ණායක හා දර්ශක ද ඊට අදාල බරතැබීම් ආදිය දිස්ත්‍රික් තීරණය කර දත්ත මත ලබාගන්නා ලකුණු ගණනය කිරීම තුළින් දුප්පත්කමේ ප්‍රමාණය අනුව අනුපිළිවෙලට අයදුම්කරුවන්ගේ ලැයිස්තු සකස් කෙරේ. මෙම නිර්ණායක, දර්ශක හා බරතැබීම් තීරණය කිරීම සඳහා අවසන්වරට පවත්වා තිබූ 2019 වර්ෂයේ කුටුම්භ, ආදායම් හා වියදම් සමීක්ෂණයේ තොරතුරු පදනම් කරගෙන ඇත.

මේ අනුව ඉහත කරුණු සැලකිල්ලට ගෙන සුදුස්සන් තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය පනතේ සඳහන් තෝරා ගැනීමේ පටිපාටියට අදාල විධිවිධාන ද සැලකිල්ලට භාජනය කරමින් සකස් කර අමාත්‍ය

මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන 2022.10.20 දිනැති අංක 2302/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරනු ලැබ ක්‍රියාත්මක කර ඇත.

මෙම තෝරා ගැනීමේ නෛතික ක්‍රියාපටිපාටිය අනුව අයදුම්පත් කැඳවා ප්‍රතිලාභ අපේක්ෂිත පුද්ගලයින්ගේ තොරතුරු ප්‍රකාශ ලබා ගැනීම සංගණන ක්‍රියාවලියක් තුළින් සිදු කරන අතර ඒවා සත්‍යාපනය කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන පනතේ විධිවිධාන හා රෙගුලාසි ප්‍රකාරව පිහිටුවා ඇති කමිටු මඟින් සිදුකෙරේ. නියමිත පටිපාටිය අනුව තෝරා ගැනීම් සිදුකර ලැයිස්තු ප්‍රසිද්ධ කිරීමෙන් පසුව අභියාචනා හා විරෝධතා කැඳවනු ලැබේ. එම අභියාචනා හා විරෝධතා නියමිත නීතිමය විධිවිධාන අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවනු ලබන අභියාචනා මණ්ඩල මඟින් විභාග කර ලබාදෙන තීරණ මත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතියෙන් සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම තෝරා ගැනීමේ ක්‍රියාවලිය හා ප්‍රතිලාභ පිරිනැමීමේ කටයුතු ඉලෙක්ට්‍රොනික තොරතුරු පද්ධතියක් තුළින් සිදුකෙරේ.

ඉහත සඳහන් කළ ගැසට් නිවේදනය ප්‍රකාරව පනවා ඇති පනත යටතේ වූ රෙගුලාසි මඟින් ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ නෛතික අවශ්‍යතාවය පනවා ඇති අතර ඒ අනුව IWMS ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය සකස් කර (තවදුරටත් සංවර්ධනය කරමින් පවති) ක්‍රියාත්මක කෙරේ. මෙම දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සඳහා 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත ප්‍රකාරව මෙම ක්‍රමවේදය 2022.11.29 දිනැති 2308/08 දරණ ගැසට්පත්‍රය මඟින් පලකර අනුමැතිය ලබා ගෙන ඇත.

3 වන පරිච්ඡේදය - සභාපතිවරයාගේ විවරණය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිතුමාගේ සමාලෝචනය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ වන වගන්ති ප්‍රකාරව පිහිටුවා අංක 1952/22 හා 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක විය.

පනත අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවන ලද අතර 1998-2023 ක්‍රියාත්මක වූ සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) මගින් සමාජ සුබසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ තාක්ෂණික මාර්ගෝපදේශ සහ පද්ධතිය සංවර්ධනය කරන ලදි.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්,ප්‍රාදේශිය ලේකම්, ග්‍රාම නිලධාරීන් ඇතුලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ක්ෂේත්‍ර රාජකාරී ඉටුකරන අනෙකුත් නිලධාරීන්ගේ සහාය ලබා ගන්නා අතර මේ යටතේ මූලිකවම අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක වේ.

2023 වර්ෂයේ ජූලි මස සිට මෙම අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන යටතේ ප්‍රතිලාභ පිරිනැමීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ඉලක්කගත ප්‍රජාව නිවැරදිව හඳුනාගත් සමාජ සුබසාධක දත්ත පද්ධතියක අවශ්‍යතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි මෙරටට ආධාර සපයන පාර්ශවකරුවන් තහවුරු කර ඇති අතර ඒ අනුව, අංක 2308/08 දරණ 2022/11/29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 2022 අංක 02 දරණ ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය (IWMS) ස්ථාපිත කර ඒ හරහා අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වුණි.

මෙම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීම මෙම වර්ෂය තුළදී ආරම්භ කිරිමට හැකිවිය. විවිධ පාර්ශව වලින් ඉදිරිපත්වූ විරෝධතා හා අභියෝග මධ්‍යයේ මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණව නොතිබූ බැවින් ඒවා සපුරාගැනිම සඳහාද විශාල වෙහෙසක් දැරීමට සිදුවිය. ඒ අනුව IWMS නමින් පරිගනක පද්ධතියක් සංවර්ධනය කිරිමේ කටයුතුද කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබාගැනීමේ හා බඳවා ගැනීමේ කටයුතුද කාර්යාල උපකරණ හා අනෙකුත් භෞතික සම්පත් සපයාගැනිමේ කටයුතුද වැඩසටහන ක්‍රියාත්මක කරන අතරතුරුම ඉටු කරගැනිම සඳහා ප්‍රයත්න දැරීමට සිදුව තිබුනි. එමෙන්ම සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියද මේ සඳහා විශාල සහයෝගයක් ලබා දුනි.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනීමට මුදල් විෂයභාර අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය ලේකම්, සහයෝගය ලබා දුන් අතර මුදල් අමාත්‍යාංශයේ හා අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් ,සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ හා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සියලුම නිලධාරින් සෑම විටකදීම නොමසුරුව සහයෝගය ලබා දුන්හ.

ජයන්ත විජේරත්න
සභාපති,සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
2023.12.30

4. වන පරිච්ඡේදය - ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්යසාධනය

4.1වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2023

2023 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සහ කාර්ය සාධනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ප්‍රතිලාභීන් හඳුනාගෙන ඊට අදාල අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම් කටයුතු සිදුකිරීම හා ඊට අදාල කටයුතු පවත්වාගෙන යාම සිදු කරන ලදි.

මෙම 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඇමුණුම 01 මගින් දක්වා ඇත.

4.2 කාර්ය සාධනය

- **උපාය මාර්ග :** සුබසාධක ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් කිරීම

වැඩසටහන : සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය අනුගමනය කිරීම හා සුබසාධක ප්‍රතිලාභීන් සඳහා ඔවුන්ගේ බැංකු ගිණුම් හරහා ගෙවීම් කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්:

ප්‍රගතිය: රෙගුලාසි සඳහා අමාත්‍ය මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම.

මෙම සුබසාධක ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් කටයුතු 2023 ජූලි මස සිට දෙසැම්බර් දක්වා අදියර වශයෙන් ක්‍රියාත්මක කරන ලදි.

- **උපාය මාර්ග :මානව සම්පත් ධාරිතා සංවර්ධනය**

වැඩසටහන: පුහුණු දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන්, වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්:ප්‍රශස්ත සේවාවක් ලබා ගැනීම සඳහා WBB කාර්ය මණ්ඩලය හොඳින් පුහුණු කිරීම

ප්‍රගතිය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ අනෙකුත් ඉහළ බලයලත් වගකිවයුතු පාර්ශව වල නිලධාරීන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදි.

- **උපාය මාර්ග :** ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් (IWMS) ක්‍රියාත්මක කිරීම.

වැඩසටහන: පද්ධතිය පුළුල් කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) මඟින් කාර්යභාරයට අදාල ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීමේ (BPR) ලේඛනය පරිශීලනය සහ විශ්ලේෂණය කිරීම.

සංවර්ධකයා/SSNP විසින් සංවර්ධනය කරන ලද පද්ධතිය ලබා ගැනීම.

දැනුම හුවමාරුවක් ලබා ගැනීම.

ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියේ (IWMS) සජීවී මෙහෙයුම ආරම්භ කිරීම

ප්‍රගතිය: පද්ධතිය මගින් ප්‍රථම වශයෙන් පද්ධතියේ මූලික අංගයන් සම්පූර්ණ කර අදාළ කාර්යයන් ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී.

උපාය මාර්ග : සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රතිපත්තිය දියුණු කිරීම

වැඩසටහන: සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය සංවර්ධනය කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ රෙගුලාසි පැනවීම හා ඒ අනුව ක්‍රියා කිරීම

ප්‍රගතිය: 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වැනි වගන්තියට අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සිදු කරන ලදි.

උපාය මාර්ග : සමාජ ලේඛනය සකස් කිරීම

වැඩසටහන: සුබසාධක ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව සකස් කර ප්‍රදර්ශනය කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: සුබසාධක ප්‍රතිලාභීන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම , සාමාන්‍ය ජනතාවගෙන් අභියාචනා කැඳවීම, අභියාචනා කමිටුව පත් කිරීම සහ සමාජ ලේඛනයේ අවසාන වශයෙන් තෝරාගත් ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම
සමාජ ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම

ප්‍රගතිය: ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම් සහ උප ක්‍රියාකාරකම් 2023 වර්ෂය අවසන් වන විට අවසන් කර ඇත.

උපාය මාර්ග : සංගඟණය කිරීමේ ක්‍රියාවලිය

වැඩසටහන: ක්ෂේත්‍ර දත්ත එකතු කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: ක්ෂේත්‍ර චාරිකා කිරීමෙන් සෑම අයදුම්කරුවෙකුගෙන්ම දත්ත රැස් කිරීම සහ දත්ත නිරවද්‍යතාවය හඳුනා ගැනීම සහ සහතික කිරීම

ප්‍රගතිය: ක්ෂේත්‍ර චාරිකා සඳහා නිලධාරීන් වෙනුවෙන් දීමනා ගෙවීම සහ ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සඳහා දීමනා ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ ඔවුන්ට එම දීමනාව ලබා දීම.

උපාය මාර්ග : මානව සම්පත් ධාරිතා සංවර්ධනය

වැඩසටහන: පුහුණු දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන්, වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: ප්‍රශස්ත සේවාවක් ලබා ගැනීම සඳහා WBB කාර්ය මණ්ඩලය හොඳින් පුහුණු කිරීම

ප්‍රගතිය: දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ අනෙකුත් ඉහළ බලයලත් වගකිවයුතු පාර්ශව වල නිලධාරීන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් සාර්ථකව පැවැත්වීම

උපාය මාර්ග : ඵලදායී සන්නිවේදනය

වැඩසටහන: සාමාන්‍ය ජනතාව සඳහා විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: මෙම ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා කෙටි කේතයක් හඳුන්වා දීම (1919- රජයේ තොරතුරු මධ්‍යස්ථානය සහ 1924 - සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය) සහ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩල වෙබ් අඩවිය යාවත්කාලීන කර ප්‍රකාශනය කිරීම – www.wbb@gov.lk

ප්‍රගතිය: ඵලදායී සන්නිවේදනයක් සඳහා මෙම ක්‍රියාවලියේ විමසීම් සහ පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා උපකාරක මෙහෙයුම් ක්‍රියාකරුවන් සමඟ උපස්ථ පහසුකම් ඇතුළු ඇමතුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.

උපාය මාර්ග : ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතියේ (IWMS) හි තිරසාර බව සඳහා සහතික කිරීම

වැඩසටහන: පද්ධතියේ අඛණ්ඩ සජීවී ක්‍රියාකාරිත්වය සඳහා යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම

ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පරිශීලකයන්ගේ පැමිණිලි සහ විමසීම් කළමනාකරණය කිරීම සඳහා විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම

ප්‍රගතිය: අදාළ බලධාරීන් සමඟ වාර්තා තබා ගැනීමට සහ උපස්ථ කිරීමට විධිමත් දෘඪාංගයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදි.

4.3 කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

මෙම සමාලෝචනය අනුව අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රතිලාභ ගෙවීම් පිණිස සුදුසු තැනැත්තන්/පවුල් තෝරා ගැනීම ‘‘අස්වැසුම’’ වැඩසටහන පිළිබඳව සවිස්තරාත්මකව 4.4 මගින් පෙන්වා දෙනු ඇත.

4.4 ‘අස්වැසුම’ වැඩසටහන යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීම

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන අනුව සියළු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන්/ පවුල් හඳුනාගැනීම සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර තිබුණි.

ඉලක්කගත ප්‍රජාව නිවැරදිව හඳුනාගත් සමාජ සුබසාධක දත්ත පද්ධතියක අවශ්‍යතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි මෙරටට

ආධාර සපයන පාර්ශවකරුවන් අවධාරණය කොට ඇති අතර එම අවශ්‍යතාවය කඩිනමින් සම්පූර්ණ කිරීමට රජයේ ප්‍රමුඛ අවධානය යොමුවී ඇත.

ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරා ගැනීම - 2022 වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ හරහා දරිද්‍රතා මට්ටමින් සිටින සහ අවදානමට ලක්වූ පවුල් වෙත ප්‍රතිලාභ ලබාදීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව සියළු දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා බලතල පවරා ඇත.

මෙම වැඩසටහන අදියර දෙකකින් ක්‍රියාත්මක වේ. පළමු අදියර සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීම හා තේරීම වන අතර දෙවැනි අදියර තේරීම් වලින් අනතුරුව ප්‍රකාශයට පත් කෙරෙන නාමලේඛනයන්හි යම් පුද්ගලයෙකුගේ නම ඇතුළත් නොවීම හේතුකොටගෙන ඉදිරිපත් කෙරෙන අභියාචනා හා නුසුදුසු තැනැත්තන් තවදුරටත් එම ලේඛනයේ ඇතුළත් වීමට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පරීක්ෂණ සිදුකර අවසන් ලේඛනය සකස් කිරීම වේ. මීට අදාළව කටයුතු කිරීම සඳහා සියළු දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත මාර්ගෝපදේශ නිකුත් කර ඇත.

සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/ පවුල් තෝරාගැනීමේ වැඩසටහන පියවර කිහිපයකින් සමන්විත වේ. එනම්,

පළමු පියවර

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුබසාධක ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය සමඟ කටයුතු කිරීමට අනුයුක්ත කරන ලද සුබසාධක ප්‍රතිලාභ තොරතුරු නිලධාරීන් දත්ත පද්ධතියේ ලියාපදිංචි කිරීම.
2. දත්ත එක්රැස් කිරීමට ක්ෂේත්‍රයට (ග්‍රාම නිලධාරී වසම් මට්ටමට) යන නිලධාරීන් (තේරීම් කමිටු/ සංගණන නිලධාරීන්) තොරතුරු පද්ධතියේ ලියාපදිංචි කිරීම.

දෙවන පියවර

1. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනා ගැනීමට අයදුම්පත් කැඳවීමට අදාළ නිවේදනය ප්‍රසිද්ධ කිරීම.
2. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් වල ඇති තොරතුරු සුබසාධක තොරතුරු ඒකකයට අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් පරිගණකගත කළ යුතුය.මෙසේ අයදුම්කරුවන්ගේ මූලික තොරතුරු ඇතුළත් අයදුම්පත පද්ධතිගත කළ පසු QR කේත සහිත අයදුම්කරුවන්ගේ නාම ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් වේ.

තුන්වන පියවර

අයදුම්කරුවන්ගේ ගෘහ ඒකක වෙත ගොස් පද්ධතිය මඟින් ලබා දුන් QR කේත සහිත ලැයිස්තුව පදනම් කරගෙන සපයා ඇති ජංගම දුරකථන යෙදවුම (Mobile App) භාවිතා කරමින් බලයලත් නම් කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් විසින් දත්ත එක්රැස් කිරීම (සංගණනය) තුන්වන පියවරයි. ක්ෂේත්‍ර නිලධාරීන් ගෘහ ඒකක වෙත ගොස් අයදුම්කරුවන්ගේ වැඩිදුර තොරතුරු එක් රැස් කිරීම අවසන් වූ පසු නිලධාරියා විසින් අයදුම්කරුට QR කේතය ඇතුළත් තොරතුරු ලබා ගැනීම සහතික කරන ලද පත්‍රිකාවක් ලබා දෙන අතර අයදුම්කරු විසින් ලබාදුන් තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කර QR කේත ඇතුළත් පත්‍රිකාවට අත්සන් තැබිය යුතුය. අවසාන වශයෙන් ක්ෂේත්‍ර නිලධාරියා විසින් ජංගම මෘදුකාංගය මඟින් එකතු කළ දත්ත පද්ධතියට මාරු කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙලෙස සවිස්තරාත්මකව රැස්කළ දත්ත පනත ප්‍රකාරව පිහිටුවනු ලබන තේරීම් කමිටුවක් මඟින් සත්‍යාපනය කළ යුතු අතර එයට ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලැබිය යුතු වේ. ඉන්පසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගේ නාම ලේඛනය පද්ධතිගත වේ.

හතරවන පියවර

සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පළ කර ඇති 2022.10.20 දිනැති අංක 2302/23 දරන ගැසට් පත්‍රයේ සඳහන් නිර්ණායක සහ දර්ශක අනුව ලකුණු ලබාදීම පද්ධතිගත ක්‍රමවේදයකට අනුව සිදු වේ. එම දරිද්‍රතා ලකුණු මත සුදුසුකම් ලැබූ තැනැත්තන්ගේ නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තේරීම් කමිටුවක් මඟින් අනුමත කර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

පස්වන පියවර

සුබසාධක ප්‍රතිලාභ පනතේ 11(1) වගන්තිය යටතේ විරෝධතා සහ අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් මණ්ඩලය විසින් ජාතික පුවත්පත් වල පළ කරනු ලැබේ. එම විරෝධතා හා අභියාචනා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගන්නා අතර, මෙම පැමිණිලි සහ විරෝධතා විභාග කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පනවා ඇති නියෝග අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් දිස්ත්‍රික් ලේකම් විමසා සුදුසු මාණ්ඩලික නිලධාරියෙකු සභාපතිවරයා වශයෙන් සෙසු සාමාජිකයන් දෙදෙනා ද පනතේ විධිවිධාන හා නියෝග ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පත් කළ යුතුය. එලෙස පත්වන අභියාචනා කමිටුව විසින් අභියාචනා හා විරෝධතා විභාග කිරීමෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසු තැනැත්තන්ගේ නාම ලේඛනයට සුදුසුකම් ලැබූ තැනැත්තන්ගේ නම් ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය අවසානයේ රාජ්‍ය සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන් සහ ප්‍රතිලාභීන්ගේ සියළු තොරතුරු ඇතුළත් ජාතික පද්ධතියක් සංවර්ධනය කිරීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය බලාපොරොත්තු වන අතර වාර්ෂිකව එය යාවත්කාලීන කිරීමටද කටයුතු කරනු ඇත.

අස්වැසුම වැඩසටහනෙහි සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

4.5 . "අස්වැසුම" වැඩසටහන සඳහා සදහා පවතින පොදු නිර්ණායක

"අස්වැසුම" සඳහා පවතින පොදු නිර්ණායක අතර ප්‍රධාන මානයන් 6ක් යටතේ දර්ශක 22ක් පවතී. අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථික මට්ටම, වත්කම්, නිවාස තත්ත්වය හා පවුලේ ජන විකාශය ප්‍රධාන මානයන් වේ. අධ්‍යාපනය යටතේ උප මානයන් 2ක් , සෞඛ්‍යය යටතේ උපමානයන් 2ක්, ආර්ථික මට්ටම යටතේ උප මානයන් 3ක්, වත්කම් යටතේ උපමානයන් 7ක්, නිවාස තත්ත්වය යටතේ උපමානයන් 6ක් හා පවුලේ ජන විකාශනය යටතේ උපමානයන් 2ක් වශයෙන් උපමාන 22ක් පවතී. මෙම නිර්ණායක අංක 2302/23 දරන 2022.10.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය - 2022 අංක 01 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ නියෝග (ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) මඟින් ප්‍රසිද්ධ කර ඇත.

4.6 පුද්ගලයින් තෝරා ගැනීම

සුභසාධන පනතේ හා ඊට අදාල රෙගුලාසි වල විධිවිධාන සහ අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ චක්‍රලේඛ වලට අනුකූලව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. අයදුම්පත් කැඳවීමේ දිනය 2022.09.01 වන අතර දිස්ත්‍රික්කය අනුව තොරතුරු සංගණනය කර ඇති අයදුම්පත් සංඛ්‍යාව පහත 4.1 වගුවේ හි දක්වා ඇත.

දිස්ත්‍රික්කය අනුව සංගණනය කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
(වගු අංක 4.1)

දිස්ත්‍රික්කය	අයදුම්පත් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	අයදුම්පත් සංඛ්‍යාව
කොළඹ	207,517	කිළිනොච්චි	29,648
ගම්පහ	264,112	මඩකලපුව	145,255
කළුතර	172,862	අම්පාර	136,052
මහනුවර	212,582	ත්‍රිකුණාමලය	86,721
මාතලේ	95,469	කුරුණෑගල	290,280
නුවරඑළිය	146,327	පුත්තලම	131,886
ගාල්ල	155,510	අනුරාධපුරය	160,857
මාතර	129,413	පොළොන්නරුව	63,608
හම්බන්තොට	111,831	බදුල්ල	155,967
යාපනය	123,196	මොණරාගල	95,045
මන්නාරම	28,878	රත්නපුර	223,549
වවුනියා	33,164	කෑගල්ල	139,048
මුලතිව්	28,192	**එකතුව**	**3,368,789**


(මූලාශ්‍රය:තොරතුරු නාක්ෂණ අංශය ඇසුරිනි)

(දිස්ත්‍රික්කය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව.)
(වගු අංක 4.2)

දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
කොළඹ	59,812	කිලිනොච්චි	18,029
ගම්පහ	98,704	මඩකලපුව	72,972
කළුතර	89,759	අම්පාර	73,839
මහනුවර	126,371	ත්‍රිකුණාමලය	45,064
මාතලේ	52,528	කුරුණෑගල	142,536
නුවරඑළිය	101,926	පුත්තලම	59,515
ගාල්ල	92,604	අනුරාධපුරය	71,670
මාතර	63,236	පොළොන්නරුව	40,211
හම්බන්තොට	62,313	බදුල්ල	115,470
යාපනය	71,235	මොණරාගල	53,795
මන්නාරම	11,027	රත්නපුර	140,031
වවුනියා	15,576	කෑගල්ල	97,952
මුලතිව්	16,150	**එකතුව**	**1,792,325**

(මූලාශ්‍රය:තොරතුරු නාක්ෂණ අංශය ඇසුරිනි)

(ප්‍රස්ථාර අංක 1)



සංගණනය කරන ලද අයදුම්පත් **3,368,789** න් (වගුව **4.2**), **1,792,325** ක් සුදුසුකම් ලබා ඇති අතර එය **53%** ක පමණ සුදුසුකම් අනුපාතයක් පිළිබිඹු කරයි (වගුව **4.3**). මෙයින් ඇඟවෙන්නේ අයදුම්කරුවන්ගෙන් අඩක් පමණ වැඩසටහනේ නිර්ණායක සපුරාලන බවයි.

කුරුණෑගල අයදුම්පත් **290,280** ක් සංගණනය කර ඇති අතර, ඉන් **142,536** ක් **(49%)** සුදුසුකම් ලබා ඇත. ලැබුණු සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් දෙඅංශයෙන්ම වැඩිම සංඛ්‍යාවක් මෙම දිස්ත්‍රික්කයට අයත් වන අතර, එය වැඩි අයදුම් කිරීමක් සහ ඉහළ සුදුසුකම් ලැබීමක් පෙන්නුම් කරයි.

ගම්පහ අයදුම්පත් **264,112** ක් සංගණනය කර ඇති අතර, කොළඹ දිස්ත්‍රික්කය අයදුම්පත් **207,517** ක් සංගණනය කර ඇති අතර, ඉහළ අයදුම්පත් සංඛ්‍යාවක් වාර්තා කරන නමුත් සාපේක්ෂව අඩු සුදුසුකම් අනුපාත (පිළිවෙලින් **37%** සහ **29%**) ඇත. මෙම ඝන ජනගහනයක් සහිත නාගරික දිස්ත්‍රික්ක දැඩි සුදුසුකම් නිර්ණායක හෝ නුසුදුසු අයදුම්කරුවන්ගේ විශාල ප්‍රතිශතයකට පෙන්නුම් කරනු ලැබේ.
සංගණනය කර ඇති අයදුම්පත් **223,549** න් සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් **140,031** ක් සමඟ රත්නපුර දිස්ත්‍රික්කය කැපී පෙනෙන අතර එය **63%** ක ඉහළ සුදුසුකම් අනුපාතයක් ලබා ගනී. ඒ හා සමානව, මහනුවර දිස්ත්‍රික්කය **(59%)** සහ බදුල්ල දිස්ත්‍රික්කය **(74%)** ශක්තිමත් සුදුසුකම් අනුපාත පෙන්නුම් කරන අතර එය අයදුම්පත් සහ වැඩසටහන් අවශ්‍යතා අතර සැලකිය යුතු පෙළගැස්මක් පෙන්නුම් කරයි.

මන්නාරම දිස්ත්‍රික්කය (**28,878** ක් සංගණනයට ලක් කර ඇති අතර, සුදුසුකම් ලත් **11,027** ක්), කිලිනොච්චි දිස්ත්‍රික්කය (**29,648** ක් සංගණනය කර ඇති අතර, සුදුසුකම් ලත් **18,029** ක්) සහ මුලතිව් දිස්ත්‍රික්කය (**28,192** ක් සංගණනය කර ඇති අතර, සුදුසුකම් ලත් **16,150** ක්) වැනි උතුරු දිස්ත්‍රික්කයේ

අයදුම්පත් සහ සුදුසුකම් යන දෙකෙහිම අඩුම සංඛ්‍යාවක් වාර්තා කරයි. මෙම කලාපවල කුඩා ජනගහනයක් හෝ වැඩසටහන පිළිබඳ අඩු දැනුවත්භාවයක් නිසා මෙය සිදුවිය හැකිය.

කොළඹ සහ ගම්පහ වැනි නාගරික දිස්ත්‍රික්කවල බදුල්ල, රත්නපුර සහ මහනුවර වැනි ග්‍රාමීය දිස්ත්‍රික්කවලට සාපේක්ෂව සුදුසුකම් ලත් ප්‍රතිලාභීන්ගේ අඩු ප්‍රතිශතයක් ඇත. මෙය ග්‍රාමීය ජනතාවට සාපේක්ෂව නාගරික පදිංචිකරුවන් අතර අඩු සහභාගීත්ව සහ සුදුසුකම් අනුපාතවලින් පිළිබිඹු වේ.

තවද, මෙම අස්වැසුම වැඩසටහන සඳහා අයදුම් කිරීමට ආරාධනා කර සුදුසුකම් ලබා ඇති අයට අමතරව, අතෘප්තිමත් අයදුම්කරුවන්ගේ අභියාචනා 2023 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද අතර දිස්ත්‍රික්කය අනුව ඉදිරිපත් කරන ලද අභියාචනා සංඛ්‍යාව වගුව අංක 4.4 හි දක්වා ඇත.
ලැබුණු අයදුම්පත්‍ර සංඛ්‍යාව (3,744,493) අනුව වගු අංක 4.1 මගින් පැහැදිලි කරන ලද ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය අනුව එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පිළිබඳ විස්තර වගු අංක 4.3 මගින් දක්වා ඇත.

(දිස්ත්‍රික් වශයෙන් ලද අභියාචනා සංඛ්‍යාව)

(වගු අංක4.3)


දිස්ත්‍රික්කය	අභියාචනා සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	අභියාචනා සංඛ්‍යාව
කොළඹ	68,512	කිලිනොච්චි	9,633
ගම්පහ	84,595	මඩකලපුව	71,574
කළුතර	43,253	අම්පාර	57,161
මහනුවර	51,477	ත්‍රිකුණාමලය	36,090
මාතලේ	27,859	කුරුණෑගල	86,487
නුවරඑළිය	31,059	පුත්තලම	39,852
ගාල්ල	39,107	අනුරාධපුරය	46,750
මාතර	40,904	පොළොන්නරුව	16,362
හම්බන්තොට	37,439	බදුල්ල	28,989
යාපනය	46.429	මොණරාගල	31,144
මන්නාරම	13,568	රත්නපුර	6,7915
වවුනියා	15,197	කෑගල්ල	27,349
මුලතිව්	10,180	**එකතුව**	**1,028,885**

(මූලාශ්‍රය:තොරතුරු තාක්ෂණ අංශය ඇසුරිනි)

2023 ජූලි මාසය වන විට අස්වැසුම වැඩසටහන යටතේ අභියාචන - 1,028,885 ක් ගොනු කර ඇති අතර,සුදුසුකම් තීරණ සම්බන්ධයෙන් අයදුම්කරුවන් අතර සැලකිය යුතු එකඟතාවයක් නොමැති බව පිළිබිඹු වේ. වැඩිම අභියාචනා සංඛ්‍යාවක් කුරුණෑගල (86,487), ගම්පහ (84,595), කොළඹ (68,512), සහ රත්නපුර (67,915) වැනි දිස්ත්‍රික්ක වලින් වැඩිම අභියාචනා සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර, එය ජනාකීර්ණ කලාපවල කැපී පෙනෙන අතෘප්තිය පෙන්නුම් කරයි. ඊට ප්‍රතිවිරුද්ධව, කිලිනොච්චිය (9,633), මුලතිව් (10,180) සහ මන්නාරම (13,568) වැනි දිස්ත්‍රික්කවල අඩුම අභියාචනා සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර, කුඩා ජනගහනය සහ අඩු ආරම්භක අයදුම්පත් නිසා විය හැක. සමස්ත අභියාචනා

අනුපාතය, විශේෂයෙන්ම ඉහළ අභියාචනා දිස්ත්‍රික්කවල, සුදුසුකම් නිර්ණායකවල සහ තීරණ ගැනීමේ විනිවිදභාවයේ වැඩි දියුණු කළ පැහැදිලි භාවයක් අවශ්‍ය බව යෝජනා කරයි.
ලැබුණු මුළු අයදුම්පත් මත පදනම්ව සංගණනනය කරන ලද අභියාචනා ප්‍රතිශතය 4.2 වගුව මගින් නිරූපණය වේ. එය 3,744,493 කි.

(ප්‍රස්ථාර අංක 2)



මෙම අස්වැසුම වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවා එයට සුදුසුකම් ලැබුවන්ට අමතරව මෙම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් නොලැබීම හේතුවෙන් අභියාචනා හා විරෝධතා යොමු කිරීම සඳහා 2023 ජූලි මස සිට ක්‍රියාත්මක කළ අතර ඊට සමගාමීව දිස්ත්‍රික් වශයෙන් ලද විරෝධතා සංඛ්‍යාව වගු අංක 4.5 මගින් දක්වා ඇත.

(දිස්ත්‍රික් වශයෙන් ලද විරෝධතා සංඛ්‍යාව)

(වගු අංක4.5)


දිස්ත්‍රික්කය	විරෝධතා සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	විරෝධතා සංඛ්‍යාව
කොළඹ	3421	කිලිනොච්චි	149
ගම්පහ	8832	මඩකලපුව	2312
කළුතර	10259	අම්පාර	3289
මහනුවර	15121	ත්‍රිකුණාමලය	3979
මාතලේ	2385	කුරුණෑගල	10048
නුවරඑළිය	2749	පුත්තලම	2756
ගාල්ල	13003	අනුරාධපුරය	3988
මාතර	8854	පොළොන්නරුව	5449
හම්බන්තොට	5229	බදුල්ල	5449
යාපනය	4050	මොණරාගල	1206
මන්නාරම	659	රත්නපුර	11854
වවුනියා	461	කෑගල්ල	8559
මුලතිව්	479	**එකතුව**	**134,540**

(මූලාශ්‍රය:තොරතුරු තාක්ෂණ අංශය ඇසුරිනි)

2023 ජූලි මාසය වන විට විරෝධතා 134,540ක් ගොනු කර ඇති බව දත්ත පෙන්වා දෙනු ලැබේ. ගාල්ල, මාතර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල විරෝධතාවලින් වැඩිම ප්‍රතිශතයක් දක්නට ලැබුණු අතර, මෙම දිස්ත්‍රික්කවල සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් 14%ක් ඔවුන්ගේ සුදුසුකම් තත්ත්වය හේතුවෙන් විරෝධය පළ කළහ. මහනුවර (12%), කළුතර (11%) සහ ගම්පහ (9%) වැනි අනෙකුත් දිස්ත්‍රික්කවල ද සැලකිය යුතු විරෝධතා අනුපාත පෙන්නුම් කරන අතර, මෙම ප්‍රදේශවල ඉහළ මට්ටමේ එකඟ නොවීමක් පෙන්නුම් කරයි. එමෙන්ම, කිලිනොච්චි (1%), මොනරාගල (2%) සහ මුලතිව් (3%) වැනි දිස්ත්‍රික්කවල ඉතා අඩු විරෝධතා අනුපාත ඇති අතර, එයින් පෙන්නුම් කරන්නේ සුදුසුකම් තීරණ සඳහා අඩු අභියෝග ඇති බවයි. සමස්තයක් වශයෙන්, රට පුරා විරෝධතා අනුපාතය සාපේක්ෂව අඩු නමුත්, ඉහළ අනුපාත ඇති දිස්ත්‍රික්කවලට ගැටළු විසඳීමට සහ සුදුසුකම් ක්‍රියාවලියේ පැහැදිලි බව වැඩි දියුණු කිරීමට ඉලක්කගත මැදිහත්වීම් අවශ්‍ය විය හැකිය.

රූප සටහන 4.3 නියෝජනය කරන්නේ වාර්තා වී ඇති මුළු විරෝධතා මත පදනම්ව, විවිධ දිස්ත්‍රික්ක හරහා ලැබුණු විරෝධතා සංඛ්‍යාව වන අතර එය 134,540 කි.

(ප්‍රස්ථාර අංක 3)



අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ගෙවීම් 2023 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද අතර 2023 දෙසැම්බර් දක්වා අඛණ්ඩව සිදු කරන ලදී. අදාළ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන්ගේ විස්තර පහත වගුවේ අංක 4.6 හි දක්වා ඇත. පවුලේ මුළු සාමාජිකයින් සංඛ්‍යාව 2ක් හෝ ඊට අඩු නම්, ඉහත සංඛ්‍යාවෙන් අඩක් පමණක් හිමිකම් ලබයි.


2023 ජූලි මාසයෙ සිට දෙසැම්බර් දක්වා ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව

(වගු අංක 4.6)

මාසය	අන්ත දුප්පත්	දුප්පත්	අවධානම්	සංක්‍රාන්තික	එකතුව
ජූලි	303,718	604,273	289,673	209,133	**1,406,797**
අගෝස්තු	277,006	570,946	277,365	200,460	**1,325,777**
සැප්තැම්බර්	296,029	593,208	283,581	205,048	**1,377,866**
ඔක්තෝබර්	302,258	605,379	290,070	209,225	**1,406,932**
නොවැම්බර්	302,498	605,780	290,256	209,348	**1,407,882**
දෙසැම්බර්	303,199	606,496	290,624	209,745	**1,410,064**

(මූලාශ්‍රය:තොරතුරු තාක්ෂණ අංශය ඇසුරිනි)

(ප්‍රස්ථාර අංක 4)



අස්වැසුම වැඩසටහන යටතේ , 2023 ජූලි මාසයේදී IWMS පද්ධතිය හරහා තනි බැංකු ගිණුම් වෙත ඉලෙක්ට්‍රොනිකව මුදල් බැර කරනු ලැබේ. මුදල් බැර කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය 2023 ජූලි මස සිට සිදු කරන ලද අතර පරීක්ෂණ ගෙවීමක් ලෙස පද්ධති දෝෂයක් හේතුවෙන් ප්‍රතිලාභීන් 39,299 දෙනෙකුට දෙගුණයක් ගෙවා තිබුණි.මෙ අගෝස්තු වන විට නිවැරදි කරන ලදි. එබැවින්, ජූලි ගෙවන ලද නිවැරදි මුදල පිළිඹිබු නොකරයි.

2023 ජූලි සිට දෙසැම්බර් දක්වා මුදල් ගෙවීමේදී ප්‍රතිලාභීන්ගේ මුළු සංඛ්‍යාව සාපේක්ෂව ස්ථාවරව පැවති අතර සෑම මසකම ආසන්න වශයෙන් මිලියන 1.3 සිට 1.4 දක්වා උච්චාවචනය විය.දුප්පත් කාණ්ඩයට 570,946 සිට 606,496 දක්වා ඉහළම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සිටියහ. අන්ත දුප්පත් කාණ්ඩයේ සංඛ්‍යාලේකන අනුව 277,006 (ජූලි) සිට 303,718 (අගෝස්තු) දක්වා උච්චාවචනය විය. අවදානම් සහ සංක්‍රාන්තික කාණ්ඩ ද් ස්ථාවරව පැවතුන අතර, අවදානම් කණ්ඩායම 277,365 (අගෝස්තු) සිට 290,624 (දෙසැම්බර්) දක්වා පරාසයක පැවති අතර, සංක්‍රාන්තික කාණ්ඩය 200,460 (අක්ෝස්තු) සිට 209,745 (දෙසැම්බර්) දක්වා පරාසයක පැවතුණි. සමස්තයක් වශයෙන්, දත්ත මගින් 2023 දෙවන භාගය පුරාවටම අවදානමට ලක්විය හැකි ජනගහනය සඳහා අඛණ්ඩ හා ඵලදායී ඉලක්ක සඳහා යෝජනාක්‍රම ක්‍රියාත්මක කරමින් මුදල් ගෙවීම ස්ථිරව සහ සහ විශ්වාසනීය ක්‍රියාත්මක කරන ලදි.


2023 ජූලි සිට දෙසැම්බර් දක්වා ප්‍රතිලාභීන් ලැබූ ප්‍රතිලාභ මුදල

(වගු අංක 4.7)

මාසය	අන්ත දුප්පත්	දුප්පත්	අවදානමට ලක්වුවන්	සංක්‍රාන්තික	එකතුව
ජූලි	3,130,245,000	3,979,406,750	1,207,622,500	447,405,000	8,764,679,250
අගෝස්තු	2,887,447,500	3,781,701,000	1,159,390,000	429,561,250	8,258,099,750
සැප්තැම්බර්	3,060,067,500	3,912,516,000	1,183,380,000	438,847,500	8,594,811,000
ඔක්තෝබර්	3,125,782,500	3,991,867,750	1,209,860,000	447,695,000	8,775,205,250
නොවැම්බර්	3,128,482,500	3,994,613,250	1,210,637,500	447,941,250	8,781,674,500
දෙසැම්බර්	3,134,325,000	3,997,902,750	1,211,900,000	448,760,000	8,792,887,750
එකතුව					51,967,357,500

(මූලාශ්‍රය:තොරතුරු තාක්ෂණ අංශය ඇසුරිනි)

(ප්‍රස්ථාර අංක 5)



2023 ජූලි සිට දෙසැම්බර් දක්වා මුදල් ගෙවීම් පිළිබඳ දත්ත මගින් ප්‍රතිලාභී සමාජ කාණ්ඩ හතර හරහා ස්ථාවර අරමුදල් බෙදා හැරීමක් පෙන්නුම් කරන අතර, මාස හය තුළ මුළු මුදල රුපියල් 51,967,357,500 ක් බෙදා හැර ඇත. දුප්පත් කාණ්ඩයට නිරන්තරයෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ලැබුණු අතර එය සෑම මසකම රුපියල් බිලියන 3.7 සිට බිලියන 3.9 දක්වා පරාසයක පවති. අන්ත දුප්පත් කාණ්ඩයට මාසික ගෙවීම් රුපියල් බිලියන 2.8 සිට බිලියන 3.1 සක්වා පවති. අවදානම් සහගත සහ සංක්‍රාන්තික කණ්ඩායම් වලට අඩු මුදල් ප්‍රමාණයක් ලැබුණු අතර, අවදානම් සහගත සහගත කාණ්ඩය සඳහා රුපියල් බිලියන 1.1 සිට බිලියන 1.2 දක්වා සහ සංක්‍රාන්තික කණ්ඩායම් සඳහා රුපියල් මිලියන 443 ක් පමණ ගෙවීම් සිදුවිය. මුදල් ගෙවීම් සිදු කිරීමේදී සමස්ත ස්ථාවරත්වය 2023 දෙවන භාගය පුරාවට අවදානම් සහගත කාණ්ඩය සඳහා ස්ථාවර අගයක් පිළිඹිබු වේ.

5 වන පරිච්ඡේදය- වර්ෂය සඳහා සමස්ත මූල්‍ය ප්‍රකාශ

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශය
(වගු අංක 5.1)

විස්තරය	සටහන	**2023(රු.)**	**2022(රු.)**
ආදායම			
රජයේ ප්‍රදාන	1	52,283,907,500	7,188,000
වියදම්			
පුද්ගල වැටුප්	2	10,747,499	5,672,268
වෙනත් මෙහෙයුම් වියදම්	3	404,669,272	1,258,933
අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම්	4	51,889,242,500	-
		52,304,659,271	**6,931,201**
වර්ෂය සඳහා අතිරික්තය/හිඟය		**(20,751,771)**	**256,799**

(මූලාශ්‍රය:මූල්‍ය වාර්තා ඇසුරිනි)

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(වගු අංක 5.2)

	සටහන	**2023 (රු.)**	**2022 (රු.)**
සංචරක 01			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	5	16,607,288	-
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	6	850,887	289,391
		17,458,174	**289,391**
මූල්‍යකරණය කළේ			
ශුද්ධ වත්කම්/ස්කන්ධය		-	-
පෙර සංචිතය		21,192,081	4,584,793
සමුච්චිත අතිරික්තය/(හිඟය)		(25,110,195)	(4,304,256)

මූළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		(3,918,114)	(280,537)
ජංගම වගකීම			
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	7	55,000	
උපචිත වියදම්	8	21,321,289	8,854
		17,458,174	**289,391**

(මූලාශ්‍රය:මූල්‍ය වාර්තා ඇසුරිනි)

මූල්‍ය ප්‍රකාශන 1-3 දක්වා පිටු වලින් ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් කරුණු 4-11 දක්වා පිටු වල ඉදිරිපත් කර ඇති ගිණුම් වලට මූල්‍ය ප්‍රකාශන වල ආකෘතිමය කොටස් වේ

මෙම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සඳහා වන සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන හා තොරතුරුවලට අනුකූලව සකස් කර ඇති බව අපි මෙයින් සහතික කරමු.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
මුදල්,ආර්ථික ස්ථායිකරන හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(වගු අංක 5.3)

	2023 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	
වර්ෂය තුළ අතිරික්තය/(හිඟය)	(20,751,771)
වැඩිවන මෙහෙයුම් පිරිවැය	-
ගැලපීම:	-
ක්ෂය වීම	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(20,751,771)**
පෙර වසර ගැලපීම	-
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ(වැඩිවීම/අඩුවීම)	(54,168)
ලැබිය යුතු දෑ (වැඩිවීම/අඩුවීම)	21,367,435
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	**561,496**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය	
දේපළ, පිරියත සහ උපකරණ මිළදී ගැනීම	-
ආයෝජන කටයුතු සඳහා යොදා ගන්නා ලද මුදල්	-
මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය	
කල්බදු ගෙවීම්	-
මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල්	-
වර්ෂය තුළ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	561,496
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	289,391
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**850,887**

(මූලාශ්‍රය:මූල්‍ය වාර්තා ඇසුරිනි)

වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් විශ්ලේෂණය කිරීම

ඇමුණුම් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්‍ය අංගයකි.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
මුදල්,ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය
(වගු අංක 5.4)

	දේපළ පිරියත හා උපකරණ සංචිතය	**සමුච්චිත අතිරික්තය/(හිඟය)**	**එකතුව**
2022/01/01 දිනට ශේෂය	4,584,793	(4,561,056)	23,737
පෙර වසරේ ක්ෂය වීම	-	-	-
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	-	256,799	256,799
2022/12/31 දිනට ශේෂය	4,584	(4,304,256)	280,537
	දේපළ පිරියත හා උපකරණ සංචිතය	**සමුච්චිත අතිරික්තය/(හිඟය)**	**එකතුව**
2023/01/01 දිනට ශේෂය	4,584,793	(4,304,256)	280,537
පෙර වසර සඳහා සංචිතය	16,607,288	-	16,607,288
සමුච්චිත අතිරික්තය		(54,168)	(54,168)
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)	-	(20,751,771)	(20,751,771)
2023/12/31 දිනට ශේෂය	21,192,081	(25,110,195)	(3,918,114)

(මූලාශ්‍රය:මූල්‍ය වාර්තා ඇසුරිනි)

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

01. පොදු කරුණු

1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1952/22 අති විශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 වන දින යළිත් ක්‍රියාත්මක වන 2002 අංක 24 සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මාසයේදී ස්ථාපිත කරන ලදී.

1.2 සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව ව්‍යවස්ථාදායක සභාව සමඟ සාකච්ඡා කර මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති විෂය භාර අමාත්‍යවරයා විසින් වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී පත් කරන ලද සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

1.3 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මහලේකම් කාර්යාලය, කොළඹ 01 හි මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටා ඇත.

1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අරමුණු

- ප්‍රධාන අරමුණ, සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා කාර්යය රාමුවක් සැලසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

සුබසාධක ප්‍රතිලාභ පනත මගින් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම පිණිස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට බලය ලබා දී ඇත.

- පනත මගින් ලබා දී ඇති හෝ පවරා ඇති බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම.
- මණ්ඩලයට පවරා ඇති බලතල දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකුට පැවරීම.
- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් සඳහා වන නිර්ණායක සැකසීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන සඳහන් කිරීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය නිශ්චය කිරීම.
- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- ප්‍රතිලාභ ලැබීමට පුද්ගලයන්ට හිමිකම් ඇති කාල සීමාව සඳහන් කිරීම.

1.5. මූල්‍ය ප්‍රකාශනය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන මෙමඟින් ඉදිරිපත් කරයි.

02. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වියදම් ප්‍රකාශය, එහි ජංගම නොවන වත්කම් ලැයිස්තුව, මූල්‍ය ප්‍රකාශය පිළිබඳ

සටහන් යන ලැයිස්තූන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.1 මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ.

2.2 අඛණ්ඩ පැවැත්ම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලසුම් කරන ලද පහත දක්වා ඇති ප්‍රතිපත්ති, සුබසාධක ප්‍රතිලාභ සඳහා සුදුසු ක්‍රමවේදයක් වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයන්ට අදාළ වේ.

2.3 පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති වසර තුනක කාල සීමාවන්ට එය අඛණ්ඩව අදාළ කර ගැනීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය අපේක්ෂා කරයි.

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

  සියලුම කාර්යාල උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තා කරනු ලබයි. උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීමේදී එකතු කළ අගය මත බද්ද සමඟ අත්පත් කර ගැනීමේ දී දරණ ලද පිරිවැයයි.

- **විස්තීර්ණ ආදායම් ප්‍රකාශ**

  (අ) ආදායම් හඳුනා ගැනීම

  ආදායමක් ලෙස සැලකෙන රජයෙන් ලැබෙන අග්‍රිම

  (ආ) වියදම් හඳුනා ගැනීම

  වියදම් ප්‍රකාශයේදී වියදම්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පරිපාලන හා සාමාන්‍ය වියදම්, සුබසාධක ප්‍රතිලාභ වියදම් හා සන්නිවේදන වියදම් ලෙස හඳුනාගනී. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා වන සියළුම වියදම්, වියදම් ප්‍රකාශයට ගෙන ඇත.

(ඇ) ක්ෂයවීම

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් පවරන ලද වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන වෙන්කර නොමැත. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වත්කම් පමණක් ක්ෂයවීම ගණනය කරන ලදී.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයුකාලය අනුව සරල මාර්ග පදනම මත පහත දැක්වෙන පරිදි ක්ෂය ගණනය කරනු ලැබේ.

ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	20%
යන්ත්‍රෝපකරණ	33.33%

(ඇ) බදුකරණය

උපයනවිට ගෙවීම් බද්ද දේශීය ආදායම් පනතේ 01 වගුව මත පදනම් වේ.

5.3 විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. TPD/C/23/49/WBB/FA මෙයි අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 අගෝස්තු 07 දින

සභාපති

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංශෝධිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුවල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අස්වැසුම ප්‍රතිලාභ සඳහා ගෙවිය යුතු බව තීරණය කර ගෙවීම සඳහා බැංකුගත කර තාක්ෂණික හේතු මත ආපසු හරවා එවා තිබූ එකතුව රු.78,115,000 ක මුදල වගකීමක් ලෙස ගිණුම්ගත නොකර කාලච්ඡේදයේ වියදමින් අඩුකර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියෙන් පවරාගනු ලැබූ සියළුම වත්කම් හඳුනාගැනීමකින් තොරව රු.16,607,288 ක් පමණක් ගිණුම්ගත කර තිබූ අතර මෙම වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍රමිති 3 හි 37 ට අනුව ආසන්නතම හා විශ්වාසදායී තොරතුරු පදනම්කරගෙන ඇස්තමේන්තු සකස් කර ගත යුවද, දේපල පිරියත හා උපකරණවලට අදාලව ගිණුම් ප්‍රතිපත්ති සටහන් "ඇ"අනුව, විධිමත් ඇගයීමකින් තොරව ක්ෂය අනුපාත ලෙස 5% සිට 33.33% ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට ආදළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්වමට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමනි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් ව්‍යයදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකපිලිසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට, නිසි මූල්‍ය වාර්තා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) අස්වැසුම ප්‍රතිලාභ ගෙවීමට ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ගෙවීම් කිරීම

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(i) අස්වැසුම ප්‍රතිලාභීන් තෝරාගැනීමට නිර්නායක සකස් කිරීම	අස්වැසුම ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 වසරේ දර්ශක පාදක කර ගනිමින් තෝරාගෙන තිබූ නමුත්, සමහර දර්ශක ඊට වෙනස්ව තිබූ බව නිරීක්ෂණය වූ අතර එම දර්ශක යොදා ගැනීමේ පදනම විගණනයට අනාවරණය නොවිය.
(ii) තෝරාගත් නිර්නායක වලට අදාල මිනුම් ගැසට් කර ප්‍රසිද්ධ කිරීම	2019 වසර සඳහා එක් පුද්ගලයෙකුගේ මාසික වියදම් වටිනාකම රු.6,999 ක් ලෙස යොදාගෙන තිබුණ ද ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනය අනුව ආදායම් හා වියදම් පිළිබඳව ප්‍රමාණාත්මක මිනුම් අගයයන් දක්වා නොතිබුණි.
(iii) නිර්නායක සකස් කිරීම සඳහා කාලානුරූපිව පදනම් වර්ෂය තෝරාගැනීම	සුබසාධක ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා පදනම් වර්ෂය ලෙස 2019 වර්ෂය ගෙන තිබුණි. එසේ වුවද, ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා සෘජු බලපෑමක් සහිත උද්ධමන අනුපාතය 2019 වර්ෂයේදී සියයට 3.53 ක පහළ අගයක් පැවතිය ද 2020, 2021, 2022 හා 2023 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 6.15, 7.01, 49.72 හා 67.4 දක්වා ඉහළ ප්‍රතිශතයකින් වැඩිවී තිබුණි. ඒ අනුව කඩඉම් වටිනාකම තීරණය කිරීමට අදාල කාලානුරූපිභාවය හා වර්තමාන සංගතභාවය නොගැලපෙන බව නිරීක්ෂණය කෙරේ.
(iv) ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ගෙවීම් කිරීම කාල රාමුව තුල සිදු කිරීම	ප්‍රතිලාභීන් තෝරාගැනීම හා දීමනා ගෙවීමට නියමකර තිබූ කාලරාමුව තුල නිමකිරීමට අදාලව විධිමත් අධීක්ෂණයක් මණ්ඩලය විසින් සිදුකර නොතිබුණි.

(v)	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම	ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒකාබද්ධ මූල්‍යාධාර කළමනාකරණ පද්ධතිය අනෙකුත් දෙපාර්තමේන්තු දත්ත පද්ධතීන් හා සම්බන්ධ කිරීමේ කාර්යයන්ගේ ප්‍රගතිය 30% ක මට්ටමක පැවතුනි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව,

2.3 වෙනත් කරුණු

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් හෙවත් අනුමත තනතුරුවලින් සියයට 75 ක් ද ද්විතීය මට්ටමේ තනතුරු 15 ක් හෙවත් අනුමත තනතුරු වලින් සියයට 94 ක් ද ඇතුළුව මණ්ඩලයේ අනුමත මුළු තනතුරු 36 න් තනතුරු 28 ක් හෙවත් අනුමත මුළු තනතුරුවලින් සියයට 78 ක් පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩු තනතුරු පිරවීමට හෝ කාර්ය මණ්ඩල සමාලෝචනය සිදුකර අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

ඩබ්.ඒ.සී. වික්‍රමරත්න
විගණකාධිපති

5.4 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/C/23/49/WBB/FA
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 අගෝස්තු 07 දින

සභාපති

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවමි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත : ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

RECEIVED
12 AUG 2024
Welfare Benefit Board

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

6 වන පරිච්ඡේදය- කාර්යභාරය ඉටුකිරීමේදී මුහුණදුන් අභියෝග හා ගැටළු

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යභාරය ඉටුකරගෙන යාමේදී,

- ප්‍රමාණවත් සේවක පිරිසක් බඳවාගෙන නොසිටීම
- IWMS පද්ධතිය හඳුන්වාදීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මතුවූ තාක්ෂණික ගැටළු සහ තාක්ෂණික දැනුමැති මානව සම්පත් හිඟභාවය
- දත්ත සංගණනය ක්‍රියාත්මක කිරීමේදී දත්ත ලබා ගන්නා අවස්ථාවේදී අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රජාවගේ සහ සංගණන නිලධාරීන්ගේ දැනුවත්භාවය අඩුබව
  ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල නිලධාරීන්ට දත්ත එක්රැස් කිරීමේදී විවිධ පාර්ශව වලින් එල්ල වූ විරෝධතා පෙන්වා දිය හැකිය.

ඇමුණුම 01

අංකය	උපාය මාර්ග	වැඩසටහන	**ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්**	**ප්‍රගතිය**
1	ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් (IWMS) ක්‍රියාත්මක කිරීම	පද්ධතිය පුළුල් කිරීමේ සූදානම් කිරීම	සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) මගින් පෙර ලියන ලද ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීමේ (BPR)ලේඛනය පරිශීලනය සහ විශ්ලේෂණය කිරීම	අවසන් කරන ලදි.
			සංවර්ධකය/SSNP විසින් සංවර්ධනය කරන ලද පද්ධතිය ලබා ගැනීම	සංවර්ධනය කළ යුතු මොඩියුල 4න් 2ක් පමණක් සංවර්ධනය කර ලබා දී ඇත.
			දැනුම හුවමාරුවක් ලබා ගැනීම	තාක්ෂණික කරුණු හුවමරු කරන ලදි
			ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතියේ (IWMS) සජීවී මෙහෙයුම ආරම්භ කිරීම	මෙහෙයුම් ආරම්භ කරන ලදි.
2	IWMS අධීක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම	පද්ධතියේ නිරවද්‍යතාවය සහ ආරක්ෂාව පිළිබඳ අඛන්ඩ අධීක්ෂණය සහ අනුගත කිරීම	පද්ධතියේ තාක්ෂණික සහ අනෙකුත් දෝෂ හඳුනා ගැනීම	හඳුනා ගන්නා ලදි.
			පද්ධතිය නිරවද්‍ය සහ විධිමත් දත්ත ගබඩාවක් ලෙස අඛණ්ඩව නිසි ලෙස පවත්වාගෙන යාම	ඉටුකර ඇත.
			පද්ධතියේ ආරක්ෂාව සඳහා ආරක්ෂක ප්‍රතිපත්ති සහ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක	මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවෙ

			කිරීම සහ සංවර්ධනය කිරීම	න් නිරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
3	IWMS හි තිරසාර බව සඳහා සහතික කිරීම	පද්ධතියේ සජීවී ක්‍රියාකාරිත්වය දිගටම පවත්වා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැලසුම් කිරීම	ප්‍රාදේශීය කාර්යාල වසම් මට්ටමේ පරිශීලකයන්ගේ පැමිණිලි සහ විමසීම් කළමනාකරණය කිරීමට විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම	පද්ධතිය මේ සඳහා සංවර්ධනය කර අවසන් නැත. භෞතික ක්‍රියාවලියක් සකස් කර ක්‍රියාවට නංවා ඇත.
			පද්ධතියේ සංශෝධන සම්බන්ධීකරණය කිරීම	පද්ධති සංවර්ධක සමඟ නඩත්තු ගිවිසුමකට සහ සංශෝධන සඳහා ගිවිසුමකට එළඹීමට මූලික කටයුතු සිදුකර ඇත.
		සංශෝධන සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රමවේද සංවර්ධනය කිරීම	අදාළ බලධාරීන් සමඟ වාර්තා තබා ගැනීමට / බැක්අප් සටහන් තබා ගැනීමට විධිමත් ඇඟවුම්ගයක් සංවර්ධනය කිරීම	මෙම කාර්යය සඳහා පද්ධතිය තවමත් සම්පූර්ණ සංවර්ධනයක් සිදු කර නොමැත. භෞතික ක්‍රියාවලිය සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත.
4	ඵලදායී සන්නිවේදනය	ප්‍රජාව දැනුවත් කිරීම සඳහා විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම	කෙටි කේත (1919-රජයේ තොරතුරු මධ්‍යස්ථානය සහ 1924 - සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය) පිළිබඳ දැනුවත් කිරීම	ක්‍රියාත්මක කරන ලදි

			ප්‍රජාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම (උදා: රූපවාහිනී / ගුවන්විදුලි දැන්වීම්)	ක්‍රියාත්මක කර ඇත.
			සුබසාධන ප්‍රතිලාභ මණ්ඩල වෙබ් අඩවිය යාවත්කාලීන කර ප්‍රකාශනය කිරීම – www.wbb.gov.lk	යාවත්කාලීන කර ඇත.
			වැඩසටහනට අදාල විමසීම් සහ පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා බැක්අප් පහසුකම් සහ හෙල්ප් ඩෙස්ක් ක්‍රියාකරුවන් ඇතුළු ඇමතුම් මධ්‍යස්ථානයක් පිහිටුවීම	උපකාරක මෙහෙයුම් ක්‍රියාකරුවන් සහිත ඇමතුම් මධ්‍යස්ථානයක් පිහිටුවන ලදි
			ප්‍රතිලාභීන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා SMS සම්බන්ධීකරණ පද්ධතියක් (Gateway) සෑදීම	ක්‍රියාත්මක කර ඇත.
5	මානව සම්පත් ධාරිතා සංවර්ධනය	පුහුණු සම්මන්ත්‍රණ, දැනුම හුවමාරු වැඩසටහන්, වැඩමුළු සහ	ප්‍රශස්ත සේවාවක් ලබා ගැනීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ, කාර්ය මණ්ඩලය හොඳින් පුහුණු කිරීම	පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

		දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ අනෙකුත් ඉහළ බලයලත් වගකිවයුතු පාර්ශව වල නිලධාරීන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	
6	යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට අදාළ යටිතල පහසුකම් හඳුනා ගැනීම	සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ හොඳ කාර්ය සාධන පරිසරයක් සඳහා යටිතල පහසුකම් වැඩි කිරීම (උදා: පරිගණක සංඛ්‍යාව වැඩි කිරීම)	යෝජනාව සකස් කර ඇති නමුත් සම්පූර්ණ කර නොමැත.
		සමාජ ලේඛනය සකස් කිරීම සහ සංවර්ධනය කිරීම		
1	සංගණනය කිරීමේ ක්‍රියාවලිය	ක්ෂේත්‍ර දත්ත එකතු කිරීම	ක්ෂේත්‍ර සංගණනය තුළින් සෑම අයදුම්කරුවෙකුගෙන්ම දත්ත රැස් කිරීම	මිලියන 3.4ක පමණ නිවාස/ පවුල් තොරතුරු සංගණනය කර ඇත.
			දත්ත නිරවද්‍යතාවය හඳුනා ගැනීම සහ සහතික කිරීම	දීමනාව ලබා දෙන ලදි
		ක්ෂේත්‍ර සංගණනය සඳහා නිලධාරීන් සඳහා දීමනා	ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සඳහා දීමනා ගෙවීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීම (සංගණන නිලධාරීන් සඳහා	දීමනාව ලබා දෙන ලදි

			අයදුම්පතකට රු.300ක දිරි දීමනාවක් ගෙවීමට සහ අයවැයෙන් රු.මිලියන 555ක අතිරේක අරමුදල් වෙන් කිරීමට කැබිනට් අනුමැතිය ලබා දෙන ලදි.- යොමුව. කැබිනට් තීරණ තොරතුරු ලිපිය අංක 23/0102/604/009).	
2	සමාජ ලේඛනය සකස් කිරීම	සුබසාධක ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව සකස් කර ප්‍රදර්ශනය කිරීම	වැඩසටහන ක්‍රියාත්මක කිරීම	අවසන් කරන ලදි
			සුබසාධක ප්‍රතිලාභීන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම	ප්‍රකාශයට පත් කිරීම
		අභියාචනා සහ විරෝධතා ක්‍රියාවලිය	සාමාන්‍ය ජනතාවගෙන් අභියාචනා හා විරෝධතා කැඳවීම	සිදුකරන ලදි
			අභියාචනා කමිටුව පත් කිරීම	සිදුකරන ලදි
			අභියාචනා ඇගයීම	99%ක් අවසන් කර ඇත.
		සුබසාධක ප්‍රතිලාභ සඳහා අවසාන තෝරාගත් ලැයිස්තුව සකස්	සමාජ ලේඛනයේ අවසාන තෝරාගත් ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ලබා දී ඇත.
			සමාජ ලේඛනය	අනුමැතිය ලබා

		කිරීම	යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	ගන්නා ලදි.
3	සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ප්‍රතිපත්තිය සකස් කිරීම	සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය සකස් කිරීම	2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වැනි වගන්තියට අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සඳහා කැබිනට් අනුමැතිය සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම	අනුමැතිය ලබා ගන්නා ලදි.
		2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ රෙගුලාසි සලකුණු කිරීම	රෙගුලාසි සඳහා කැබිනට් මණ්ඩලයේ සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම	අනුමැතිය ලබා ගන්නා ලදි
4	සුබසාධක ප්‍රතිලාභීන් සඳහා ගෙවීම කිරීම	සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය අනුගමනය කිරීම	සුබසාධක ප්‍රතිලාභීන් සඳහා ඔවුන්ගේ බැංකු ගිණුම් හරහා ගෙවීම් කිරීම	89.61% (භෞතික ඉලක්කය) ❖ ඉලක්කගත ප්‍රතිලාභීන් මිලියන 2කි. ❖ ගෙවූ සැබෑ ප්‍රතිලාභීන් මිලියන 1.7 (රු. මිලියන 51,889)